## ශීර්ෂය - 315 - උතුරු පළාත් සභාව
## උතුරු පළාත් සභාවේ ගිණුම් පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2010

1. **මෙහෙවර හා ප්‍රධාන කාර්යයන්**

(අ) **මෙහෙවර**

යටිතල පහසකම් පුනරුත්ථාපනය හා මානව සම්පත් හැකියාවන් සංවර්ධනය කිරීම සමඟ සේවා සහ පහසුකම් නැවත ක්‍රියාත්මක කිරීම මගින් උතුරු පළාතේ ජනතාව සඳහා ජීවනෝපායයන් ප්‍රතිස්ථාපනය කිරීමයි.

(ආ) **ප්‍රධාන කාර්යයන්**

උතුරු පළාත් සභාවේ ප්‍රධාන කාර්යයන් සකස් කර 2012 අගෝස්තු 31 වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2. **වාර්ෂික ක්‍රියාකාර සැලැස්ම**

උතුරු පළාත් සභාව විසින් වාර්ෂික ක්‍රියාකාර සැලැස්ම ගිණුම් වර්ෂය ආරම්භයේදී පිළියෙල කර නොතිබුණි.

3. **ගිණුම්**

3.1 **මුළු ප්‍රතිපාදනය හා වියදම**

උතුරු පළාත් සභාව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.11,981,170,000 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ඉන් රු.11,323,814,780 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ඉතිරිවීම් රු.657,355,220 ක් වූ අතර එය ශුද්ධ ප්‍රතිපාදනයෙන් 5.48% ක් විය. විස්තර පහත දැක්වේ.

| වියදම් වර්ගය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය | ශුද්ධ ප්‍රතිපාදනය | වියදම | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | % |
| පුනරාවර්තන | 8,400,000,000 | 8,700,000,000 | 8,700,000,000 | - | - |
| මූලධන | 3,281,170,000 | 3,281,170,000 | 2,623,814,780 | 657,355,220 | 20.02 |
| එකතුව | 11,681,170,000 | 11,981,170,000 | 11,323,814,780 | 657,355,220 | 5.48 |

## 3.2 විගණනය හා විගණන විෂය පථය

උතුරු පළාත් සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන , සැසඳුම් ප්‍රකාශන , පොත්පත් , ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2011 සැප්තැම්බර් 21 දින ප්‍රධාන ලේකම් වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ , අදහස් දැක්වීම් සහ සොයා ගැනීම් , විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනු වල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 3.3 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරියාගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්ට හා රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසි වලට අනුකූලව පවත්වා ගෙනයාම , පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ගණන්දීමේ නිලධාරියාගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම , ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**3.4 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ පිළිබඳ විගණන නිරීක්ෂණය**

2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වු මුල්‍ය ප්‍රකාශන හා පොත්පත් අනුව මෙහි (අ) සහ (ආ) ඡේද වල ඇතුළත් පොදු නිරීක්ෂණ හා 3.5 හා 3.6 ඡේදවල ඇතුළත් ප්‍රධාන විගණන නිරීක්ෂණ වලින් වන බලපෑම හැර උතුරු පළාත් සභාවේ විසර්ජන ගිණුම් සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය වේ.

**(අ) ගිණුම් ඉදිරිපත් කිරීම**

උතුරු පළාත් සභාව විසින් ගිණුම් පිළියෙල කිරීම හා විගණනයට ඉදිරිපත් කිරීම පිළිබඳ තත්ත්වය පහත දැක්වේ.

| ගිණුමේ නම | ගිණුම්අංකය | 2010 වර්ෂයට අදාල ගිණුම් 2011 මාර්තු 31 දිනට ගිණුම් විගණනයට ඉදිරිපත් කිරීම |
|---|---|---|
| විසර්ජන ගිණුම | 315 | ඉදිරිපත් කර නැත. |

සමාලෝචිත වර්ෂය සඳහා විසර්ජන ගිණුම 2011 මැයි 10 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

**(ආ) අයවැය විචලනය**

මහා භාණ්ඩාගාරය විසින් මුදා හරින ලද රු.11,981,170,000 ක් වු සමස්ථ ප්‍රතිපාදනයම වියදම ලෙස විසර්ජන ගිණුමේ දක්වා තිබුණි. කෙසේ වුවද පළාත් සභාවේ ගිණුම් පොත් අනුව රු.11,323,814,780 ක මුදලක් පමණක් සමාලෝචිත වර්ෂය තුළදී උපයෝජනය කර තිබුණි. එබැවින් මධ්‍යම රජයෙන් ලැබුණු අග්‍රිම වලින් දරන ලද වියදම හා ඒ මත ඉතිරිය පිළිබඳ යථා තත්ත්වය විසර්ජන ගිණුමෙන් හෙළිදරව් නොවේ.

**3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම**

ගිණුම් පොත් හා අදාල ගෙවීම් ලියකියවිලි ආදි සාක්ෂි නොමැතිවීම හේතුවෙන් එකතුව රු.45,354,769 ක් වු පළාත් සභාවේ ගණුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

**3.6 ගිණුම් පොත් පවත්වා ගැනීම**

භාණ්ඩාගාරයෙන් ලැබුණු ප්‍රතිපාදන වලින් දරන ලද වියදම හා පළාත් සභාව විසින් රැස්කර ගත් ආදායමෙන් දරන ලද වියදම් හඳුනා ගැනීමට හැකි වන පරිදි ගිණුම් පොත් හා ලේඛන වෙනම පවත්වා නොතිබුණි.